# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1198/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 20/07/2024 පැය 1300

## මාධ්‍ය නිවේදනය

**අම්බලන්ගොඩ ඌරවත්ත ගංගාරාම විහාරස්ථානයේ වාර්ෂික පෙරහර හේතුවෙන් ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගය අවහිර වීම - අම්බලන්ගොඩ පොලිස් වසම.**

අම්බලන්ගොඩ ඌරවත්ත ගංගාරාම විහාරස්ථානය මඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික පෙරහර 2024.07.21 වන දින පස්වරු 01.00 සිට පස්වරු 07.30 දක්වා කාලය තුල විහාරස්ථානයෙන් ආරම්භ වී අම්බලන්ගොඩ පරණ පාරෙන් සිරිකත වටරවුමෙන් හැරී එතැන් සිට ගාලු පාර කොළඹ ප්‍රධාන මාර්ගය හරහා නැවත ඌරවත්ත ගංගාරාම විහාරස්ථානයට පැමිණීමට නියමිතය.

එම කාලය තුල ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ අධික රථවාහන තදබදයක් ඇති විය හැකි බැවින් පෙරහර ගමන් ගන්නා කාලය තුල පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

### විකල්ප මාර්ග

- ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වන වාහන සංඝරාජ හන්දියෙන් කැපුඇල පාර, වතුගෙදර, පොල්වත්ත හංදියෙන් බටපොළ, මීටියාගොඩ, කහව හරහා ගාලු පාර දක්වා ගමන් කළ හැකිය.

- කොළඹ සිට ගාල්ල දක්වා ගමන් කරනු ලබන වාහන කහව, මීටියාගොඩ, බටපොල, පොල්වත්ත හන්දිය, වතුගෙදර, හීනටියන පාර, බලපිටිය හරහා ගාලු පාරට ගමන් කළ හැකිය

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**